ඒකාබද්ධ සේවා චක්‍රලේඛ ලිපි: 04/2019

මගේ අංකය : PA/CS/POLICY/සේවා ගැටළු
රාජ්‍ය පරිපාලන, ආපදා කළමනාකරණ සහ
පශු සම්පත් සංවර්ධන අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2019.10.18

සියලුම ආමාත්‍යාංශ ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත

**<u>කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හා I ශ්‍රේණිවලට 2013.04.02 දින සිට උසස් කිරීම/ උසස් කිරීම් පෙරදාතම් කිරීම මත වැටුප් වර්ධකයක් අඩුවීම සම්බන්ධයෙන් සහන සැලසීම</u>**

අංක 1840/34 දරන 2013.12.11 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව 2013.04.02 දින සිට ක්‍රියාත්මක වීම මත, 2004.12.24 දිනැති අංක 1372/23 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව අනුව 2013.04.02 දිනට පසු දිනක සිට කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හෝ I ශ්‍රේණියට ලබා දී ඇති උසස්වීම, 2013.04.02 දිනට ලැබීම මත වැටුප් වර්ධක අඩුවීම සම්බන්ධයෙන් සිදුව ඇති වැටුප් විෂමතාව නිවැරදි කරන ලෙසට නියෝජනයන් මා වෙත ඉදිරිපත් වී ඇත.

02. ඉහත පරිදි සිදුව ඇති වැටුප් විෂමතාව ඉවත් කිරීම සඳහා ආයතන අධ්‍යක්ෂ ජනරාල්ගේ සහ ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිරීක්ෂණ සහ රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමතිය අනුව පහත සඳහන් පරිදි ක්‍රියා කරන ලෙස දන්වා සිටිමි.

> අංක 1840/34 දරන 2013.12.11 දිනැති ගැසට් පත්‍රයේ පළකරන ලද කළමනාකරණ සේවා නිලධාරී සේවා ව්‍යවස්ථාව 2013.04.02 දින සිට ක්‍රියාත්මක වීම මත එකී සේවා ව්‍යවස්ථාවේ විධිවිධාන අනුව 2013.04.02 දිනට කළමනාකරණ සේවා නිලධාරී සේවයේ II හෝ I ශ්‍රේණියට උසස්වීම් ලැබූ නිලධරයන්ගේ එම උසස්වීම, **වැටුප් සැකසීමේ කාර්යය සඳහා පමණක්** 2013.04.02 දිනට පසුව එළඹුණු පෙර ශ්‍රේණියේ/කලින් ලද උසස්වීමට අදාළ වැටුප් වර්ධක දිනයේ සිදු වූවා සේ සලකා වැටුප් පරිවර්තනය සිදු කළ යුතුය.

03. ඉහත 02 ඡේදයේ පරිදි වැටුප් පරිවර්තනය සිදු කළ පසු ඉදිරි වැටුප් වර්ධක දිනය ලෙස නිලධරයාගේ සත්‍ය උසස්වීම් දිනය සැලකිය යුතුය.

කේ.වී.පී.එම්.ජේ. ගමගේ
ඒකාබද්ධ සේවා අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් :

1. ලේකම්, රාජ්‍ය සේවා කොමිෂන් සභාව - කරු. දැ.ගැ.ස.
2. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කරු. දැ.ගැ.ස.